20 වන පිටෙන්

පිටුවල ද ඒ බව දක්වා ඇත. එහෙත් එම තීන්දුවේ 79 වන පිටුවේ සඳහන් වන්නේ 'ෆෙඩ්රිකාගේ ප්‍රවෘත්තිය තහවුරු කිරීමකින් තොරව පළ කළා යැයි කිව නොහැක' යනුවෙනි. ෆෙඩ්රිකා ප්‍රවෘත්තිය පළ කර ඇත්තේ තහවුරු කරගැනීමකින් පසුව බවට නිගමනය කරන්නේ නම් ජෙනරාල්ට එරෙහිව නගා ඇති චෝදනාවේ සඳහන් පරිදි ජෙනරාල්ගේ කරන ලදැයි කියන ප්‍රකාශය 'කටකතාවක් හෝ ව්‍යාජ ප්‍රකාශයක්' නොවේ. එසේ නම් 'කටකතාවක් හෝ ව්‍යාජ ප්‍රකාශයක් කළ බවට වන චෝදනාවෙන් ජෙනරාල් නිදොස් කොට නිදහස් කළ යුතුය. ජෙනරාල් කළ බව කියන ප්‍රකාශය තහවුරු කර ගැනීම සඳහා ෆෙඩ්රිකා ගෝඨාභය රාජපක්ෂ දුරකථනය මගින් සම්බන්ධ කරගැනීමට උත්සාහ කළ බවත් එහෙත් සම්බන්ධ කරගැනීමට නොහැකි වූ බවත් ඇය සාක්ෂි දෙමින් පවසා ඇත. එහෙත් ගොඨාභය රාජපක්ෂ සාක්ෂි දෙමින් පවසා ඇත්තේ එවැනි විමසීමක් නොකළ බවත් එසේ විමසීමක් කළ බවට දැනුමක් නොතිබුණු බවත්ය. ඒ අනුව පැමිණිල්ලේ සාක්ෂිවල බරපතල ගැටුමක් තිබේ. එහෙත් බහුතර විනිසුරු දෙපොළ ඒ ගැන කිසිදු අවධානයක් දක්වා නොමැත. එබැවින් ඔවුන්ගේ තීන්දුව නීතියට පටහැනිය.

15. විත්තිය විසින් ෆෙඩ්රිකාගෙන් අසන ලද හරස් ප්‍රශ්ණවලට ඇය දුන් පිළිතුරු මගින් තහවුරු වූයේ ෆෙඩ්රිකා ජෙනරල් ෆොන්සේකා සමග අමනාපයකින් කටයුතු කළ බවත්, කුමණ හෝ ආන්දෝලනාත්මක පුවතක් පළකර සම්මානයක් දිනාගැනීමේ අරමුණක් ඇයට තිබුණු බවත්ය. එහෙත් බහුතර විනිසුරු දෙපොළ සිය තීන්දුවෙහි දක්වා තිබෙන්නේ 'වූදිත සමග ෆෙඩ්රිකා ජෑන්ස් කිසියම් හෝ තරහක් තිබූ බවට විත්තිය විසින් යෝජනාවක් නොකළ අතර ඒ ගැන සැකයක් හෝ මතු කිරීමට විත්තියට නොහැකි විය' යනුවෙනි. බහුතර විනිසුරු දෙපොළ ෆෙඩ්රිකාගේ සාක්ෂිය අධිකරණමය මනසකින් මෙහෙයවා නිසි අවධානයකින් විශ්ලේෂණය කර නොමැති බව මින් පැහැදිලිය. එබැවින් ඔවුන්ගේ තීන්දුව පිළගත් නීතියට පටහැනිය.

16. බහුතර තීන්දුවට එළැඹි විනිසුරුවරුන්ගේ නිගමනයන්හි එන දුර්වලතාවයන් ගණනාවකි. බහුතර විනිසුරු දොපොළ

★ ෆෙඩ්රිකාගේ සාක්ෂිය සමස්ථයක් ලෙස ඇගයීමකට ලක්කර නොමැත. එමෙන්ම එම සාක්ෂිය, සාක්ෂි පිළිබඳ නීතියෙහි දක්වා ඇති කිසිම පරීක්ෂණයකින් සමත්වන්නේද යන්න කෙරෙහිද අවධානය යොමුකර නොමැත.

★ ඉදිරිපත් කරන චෝදනා පැමිණිල්ලේ සාක්ෂි මගින් සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කළ යුතු බවට වන අපරාධ නීතියේ එන මූලික සිද්ධාන්තය බැහර කරමින් ජෙනරාල් ෆොන්සේකා වරදකරු කර තිබේ.

★ සමස්ථ සාක්ෂි අධිකරණමය මනසකින් විශ්ලේෂණය නොකොට, තෝරාගත් සාක්ෂි උපයෝගී කරගනිමින් පැමිණිල්ල චෝදනා ඔප්පු කළ බවට නිගමනය කර ඇත. එමෙන්ම සාධාරණ සැකයෙන් ඔබ්බට පැමිණිල්ල සිය චෝදනා ඔප්පුකළ යුතුය සහ පැමිණිල්ලේ දුර්වලතාවයන් විත්තියේ සාක්ෂිවලින් ආවරණය නොකළ යුතුය යන අපරාධ නීතියේ මූලික සිද්ධාන්තයන්ට පටහැනිව තීන්දුව ප්‍රකාශ කර ඇත.

★ 'වූදිතගේ ප්‍රකාශයේදී ඔහු රක්මිෂ් විජේවර්ධන සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡාව ලිව්වා කියා ප්‍රකාශ කරන ලද අතර, එය පටිගත කළා කියා ඔහු සඳහන් කළේ නැත'
යනුවෙන් බහුතර විනිසුරු දෙපොළ සිය තීන්දුවේ 72 පිටුවේ දක්වා තිබේ. එම තීන්දුවේම 57 වන පිටුවේ මෙසේ සඳහන් වේ.

'ඔහු ඉදිරියේ ෆෙඩ්රිකා ජෑන්ස් සටහන් යොදා නොගත් බවත්, ඔහු පැවසූ කිසිවක් සටහන් පොතක නොලියූ බවත්, අධිකරණයට ඉදිරිපත් කරන ලද සටහන් පොත පසු අවස්ථාවකදී අසත්‍ය පුවතක් නැගීමේ චෝදනාවෙන් ගැලවීම සඳහා ඇය විසින්ම නිර්මාණය කරන ලද්දක් බවත් කියා සිටින ලදි'

ජෙනරල් ෆොන්සේකා ප්‍රකාශ කර ඇත්තේ ඔහු රක්මිෂ් හා කළ සාකච්ඡාව පිළිබඳව ය. එමගින් ෆෙඩ්රිකා ජෙනරල් සමග කළා යැයි කියන සාකච්ඡාව පටිගත නොකළ බව ඔප්පු නොවේ.

★ ජෙනරල් කරන ලද බව කියන ප්‍රකාශයෙන් ජාත්‍යන්තර මට්ටමින් ශ්‍රී ලංකාවට අගතියක් සිදුවූ බව පැමිණිල්ලේ සාක්ෂිකරුවන් වූ ෂෙනුකා සෙනෙවිරත්න, ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ සහ සවේන්ද්‍ර සිල්වාගේ සාක්ෂිවලින් පෙනීයන බව බහුතර විනිසුරු දෙපොළ සිය තීන්දුවේ දක්වා ඇත. එහෙත් ෂෙනුකා සෙනෙවිරත්න සහ විත්තියේ සාක්ෂිකරුවකු වූ රජීව විජේසිංහගේ සාක්ෂි විශ්ලේෂණයේදී එවන් බලපෑමක් සිදුව නැති බව ඔප්පු වී තිබේ.

★ ජෙනරල් ෆොන්සේකා ජනපති රාජපක්ෂ සහ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ කෙරෙහි දැඩි තරහකින් යුතු වූ බව විත්තිකූඩුවේ සිට ජෙනරල් කළ ප්‍රකාශවලින් පෙනී යන ලද බව බහුතර විනිසුරු දෙපොළගේ තීන්දුවෙහි සඳහන්වේ. නමුත් සාක්ෂිවලින් එය ඔප්පු වී නොමැත.

★ පැමිණිල්ලේ 13 වන සාක්ෂිකරු කාන්චනමාල් කුඩාගම
'ඔහු රූපගත කළ දර්ශන බවට පිළිත් නමුත් වචන ගැන ඔහුට කීමට නොහැකි බව කියා සිටින ලදි' යනුවෙන් බහුතර විනිසුරු දොපොළ සිය තීන්දුවෙහි 27 පිටුවේ සඳහන් කර ඇත. එහෙත් කුඩාගමගේ සාක්ෂිය පිළිගෙන ඇත.

17. අපරාධ නඩුවකදී අධිකරණය විසින් සළකා බැලිය යුතු මූලිකම කාරණය පැමිණිල්ලේ චෝදනා පැමිනිල්ලේ සාක්ෂි මගින් සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කරනු ලැබ තිබේද යන්නයි. එහෙත්
,
ෆෙඩ්රිකාගේ සාක්ෂිය ඇයගේ සාක්ෂිය තුළම සහ සෙසු සාක්ෂි සමග බරපතල ලෙස ගැටීම,
,
ෆෙඩ්රිකාගේ සාක්ෂිය අනෙකුත් සාක්ෂි මගින් තහවුරු කර නොතිබීම,
,
ජෙනරල්ට එරෙහිව ඇති අධිචෝදනාව සෙසු සාක්ෂි මගින් තහවුරු වී නොතිබීම,
යන කරුණු අනුව චෝදනා සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කිරීමට පැමිණිල්ල සමත්ව ඇත්ද යන්න පිළිගත් නීති සිද්ධාන්තයන්ට අනුව විශ්ලේෂණය කිරීමට බහුතර විනිසුරු දෙපොළ අපොහොසත්වී ඇත.

18. ජෙනරල් ෆොන්සේකා වරදකරු කර දඩුවම් නියම කරන අවස්ථාව වන විට ඔහුට එරෙහිව චෝදනා ගොණුකර තිබූ හදිසි නීති රෙගුලාසි රට තුළ ක්‍රියාත්මක නොවේ. ඒවා අහෝසි කර බල ශුන්‍ය කර තිබේ. දඩුවම් නියම කරන්නේ ඒ වන විට නොපතින නීතියක් යටතේ බව බහුතර විනිසුරු දෙපොළේ අවධානයට ලක්ව නොමැත.

19. පැමිණිල්ලේ සාක්ෂි මගින් චෝදනා සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පුකර නොමැති අවස්ථාවක විත්තියේ සාක්ෂි සළකා බැලීමට බහුතර විනිසුරු දෙපොළ කටයුතු කර ඇත. එය පිළිගත් නීති සිද්ධාන්තයන්ට පටහැනිය. විත්තිකරුගේ ප්‍රකාශ ඇගයීමකට ලක්කර චෝදනා පත්‍රයේ සඳහන් වරද කිරීමේ චේතනාවක් විත්තිකරුට තිබුණේද යන්න විමසීම කෙරෙහි බහුතර විනිසුරු දෙපොළ අවධානය යොමුකර නොමැත. අසත්‍ය කරුණු පළකිරීම සම්බන්ධයෙන් නඩුවල විත්තිකාරියක වන, එමෙන්ම ශ්‍රේෂ්ඨාධිකරණයෙන් සමාව ගෙන සිටින ෆෙඩ්රිකාගේ සාක්ෂිය සහ වසර 40ක සිය සේවා කාලය තුළදී කිසිම චෝදනාවකට ලක්නොවුණු එමෙන්ම ඉටු කළ සේවය වෙනුවෙන් සේවා කාලය තුළදී ප්‍රථම වතාවට තරු හතරේ ජෙනරාල් පදවියකින් පිදුම්ලද හිටපු හමුදාපතිවරයාගේ සාක්ෂිය සංසන්දනාත්මකව ඇගැයීමට බහුතර විනිසුරු දෙපොළ අසමත්ව ඇත.

20. විත්තිකාර ජෙනරාල්වරයා වරදකරු කරමින් නියම කළ දඩුවම අධිකතර ය. මෙහිදී විත්තිය විසින් දඩුවම් අඩුකිරීම සම්බන්ධයෙන් දක්වන කරුනු කෙරෙහි බහුතර විනිසුරු දෙපොළ කිසිදු අවධානයක් යොමුකර නොමැත. දඩුවම් නියම කිරීමේදී අත්හිටවූ සිර දඩුවමක් ලබාදීමට බහුතර විනිසුරු දෙපොළ අසමත්ව ඇත. ජෙනරල්වරයා රට වෙනුවෙන් වසර 40 ක් සිදු කළ සේවය හෝ එකී කටයුතු කිරීමේදී ඇතිවූ සෞඛ්‍ය අපහසුතා කෙරෙහි බහුතර විනිසුරු දෙපොළ අවධානයක් යොමුකර නොමැත.

21. ඉහත සියලු කරුණු අනුව බහුතර විනිසුරු දෙපොළේ ජෙනරල් වරදකරු කරමින් දුන් තීන්දුව
,පිළිගත් නීති සිද්ධාන්තයන්ට පටහැනි බවත්
,පැමිණිල්ලේ සාක්ෂි නිසි ඇගයීමකින් තොරව දෙන ලද තීන්දුවක් බවත්
,පැමිණිල්ලේ චෝදනා පැමිණිල්ල විසින් සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පුකර ඇතිද යන්න නිසි ලෙස පරීක්ෂා කර බැලීමකින් තොරව දුන් තීන්දුවක් බවත්

,රට තුළ නොපවතින නීතියක් යටතේ විත්තිකරු වරදකරු කර දඩුවම් කර ඇති බැවින් එකී තීන්දුව සහ දඩුවම බලශුන්‍ය වන බවත් සිය අභියාචනයෙන් ජෙනරල්වයා ප්‍රකාශ කරයි. මෙළෙස කරුණු දක්වමින් ජෙනරල්වරයා ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉල්ලා සිටින්නේ කොළඹ මහාධිකරණයේ ත්‍රිපුද්ගල විනිශ්චය සභාවේ බහුතර විනිසුරු දෙපොළ 2011 නොවැම්බර් 18 දෙන ලද 'සුදු කොඩි' නඩුවේ තීන්දුව සහ දඩුවම අහෝසි කරන ලෙසිනි. තවද විත්තිකරු සියලු චෝදනාවලින් නිදොස් කොට නිදහස් කරන ලෙසද, නඩු ගාස්තු සහ ශ්‍රේෂ්ඨාධිකරණයට හැගී යන වෙනත් සහන ලබාදෙන ලෙසද ජෙනරල් ඉල්ලා සිටියි.

මේ ලිපිය සකසන අවස්ථාව වන විට මේ පෙත්සම ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කර ඇතත් සලකා බැලීමකට ලක්කර නැත. ඉදිරි දිනයක එය සලකා බැලෙනු ඇත.

දේශපාලන සිද්ධාන්ත අනුව අධිකරණ බලය වෙනත් බලයකට යටත් නැත. සිද්ධාන්තමය වශයෙන් අධිකරණය එසේ ස්වාධීන වුවත් ශ්‍රී ලංකාවේ පවතින තත්ත්වය තුළ අධිකරණයට පූර්ණ වශයෙන් ස්වාධීනව ක්‍රියා කිරීමේ ප්‍රායෝගික හැකියාවක් ඇතිද යන්න විමසා බැලිය යුතුය. ඉහළ අධිකරණයේ විනිසුරන් පත්කිරීමේ පූර්ණ බලය ඇත්තේ විධායක ජනාධිපතිටය. ඒ අනුව විනිසුරුවරයකුගේ වෘත්තිය අනාගතය තීරණය කරන්නා බවට විධායක ජනාධිපති පත්ව ඇත. එවැනි පසුබිමක ජනාධිපතිවරයාගේ දේශපාලන අනාගතය කෙරෙහි ඉතා තීරණාත්මකව බලපාන, ජනාධිපතිවරයා වෙනුවෙන් අටවන නඩුවල විත්තිය කවර තත්ත්වයක් යටතේ හෝ වේවා නිදොස් කර නිදහස් කරන්නට අධිකරණයට හැකිවේද? එවැනි හැකියාවක් වෙතොත් එය ඇත්තේ සිය ජීවිතය දෙවැනි කොට යුක්තිය පසිඳලීමේ කාරිය පළමුව ඉටු කරන්නට තරම් නිර්භීත උත්තම ගණයේ විනිසුරුවරයකුට හෝ විනිසුරුවරියකට ම පමණක් නොවන්නේද ?

ශ්‍රීලාල් සෙනෙවිරත්න

ප්‍රාඥයකුගේ වසරක සාහිත්‍ය අස්වැන්න

ප්‍රවීණ ලේඛක
ඩී බී කුරුප්පු ගේ
ග්‍රන්ථ 13 ක් දොරට වඩින වගයි



- සරළ සිංහල වියරණ වීදි
- අරබත් දරුවෝ 1 සිට 7- පරිවර්තන
- මග හොඳට නොතිබුණත් - ස්ථිය ලිඛිත වර්තාපදානය
- දානයේ ආනිසංශ
- පිතු හදක ඇත සිහිනි හිඩයක් - නවකතාව
- නැතත් රු ගත් ඊකත් මූලය - පරිවර්තන
- සුමුදු බොදු බවුන් මග

2012
පෙබරවාරි 18
සෙනසුරාදා
සවස 3

Uniting Church Hall
482 High Street Road
Mt Waverley
Mel 61G12

මූලාසනය
ප්‍රවීණ මාධ්‍යවේදී
සේනාධීර පියසේන (ඇස් පියසේන)

වැඩි විස්තර
බන්දු දිසානායක 0419874469

Chemistry-VCE/IB
Individual and group

Priyantha Liyanage
0407664546